## උතුරු පළාත් සභාව – 2023

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උතුරු පළාත් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2024 ජූලි 15 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 19 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.1 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැ◌ෙබ්.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජේදුරුතුඩුව මූලික රෝහලට 2022 වර්ෂයේ ඉදිකිරීම් අවසන් කර භාරදුන් රු.116,653,375ක්වූ ගොඩනැගිලි පළාත් සභා අරමුදල් ගිණුමේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දෝෂයකින් හෙළිදරව් කර නොතිබුණි.<br>එනමුත්, 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කරනු ලැබේ. | නිවැරදි වටිනාකම ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් සභාවේ අමාත්‍යාංශයක සහ දෙපාර්තෙමේන්තු 11ක එකතුව රු.203,091,050ක්වූ වත්කම් 39 ක් අදාල ආයතනයන්හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල ඇතුළත් නොකිරීමෙන් පළාත් සභා අරමුදල් ගිණුමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් නොකළ වත්කම්වලින් රු.113,557,740ක් ගිණුම්ගත කර ඇති අතර ඉතිරිය ගිණුම්ගත කිරීමට කටයුතු ගෙන ඇත. | -එම- |
| (ඇ) | පළාත් ආයතන 06 ක හිමිකමක් නොමැති ඉඩම් හා දෙවරක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ඇතැම් වත්කම් නිසා එකතුව රු.993,930,350ක වත්කම් පළාත් සභා අරමුදල් ගිණුමේ වැඩියෙන් දක්වා තිබුණි. | ඔබ විසින් සඳහන් කළ දෙපර්තමේන්තු 06 විසින් ක්‍රියාමාර්ග ගෙන ඇත. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ පළාත් අමාත්‍යාංශ 03ක් සහ දෙපර්තමේන්තු 05 ක් විසින් වෙන්දේසියේ විකිණීම සඳහා එකතුව රු. 16,970,739 ක් වූ මෝටර් රථ 56 ක් අදාල ආයතනවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවලින් ඉවත් කර පළාත් භාණ්ඩාගාරයට මාරුකර තිබුණි. මෙම මෝටර් රථ වාර්තා කරන දිනටත් වෙන්දේසි කර නොතිබූ අතර භෞතිකව පවතින එම වත්කම්වල පිරිවැය පළාත් සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම්වල දක්වා නොතිබුණි. | වෙන්දේසියේ විකිණීමට අදාල කටයුතු සිදුවෙමින් පැවැතීම නිසා 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම අභාවිත මෝටර් රථවල වටිනාකම මූල්‍ය නොවන වත්කම් ලෙස ඇතුළත් කර නොතිබුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හෙළිදරව් කිරීමට පියවර ගතයුතුය. |
| (ඉ) | නෙදර්ලන්ත රජය විසින් රු. බිලියන 4 ක වියදමින් පේදුරුතුඩුව මූලික රෝහලට වෛද්‍ය උපකරණ හා ලීබඩු සහිතව ඉදිකර භාරදුන් ගොඩනැගිලි ඇතුළත් වත්කම් පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කර නොතිබීමෙන් පළාත් අරමුදල් ගිණුමේ වත්කම්වල මේවා හෙළිදරව් කර නොතිබුණි. තවද, විශේෂ හදිසි අනතුරු ඒකකය සඳහා අවශ්‍ය හෙදියන්, වෛද්‍යවරුන් හා ඒ ආශ්‍රිත කාර්ය මණ්ඩලය රෝහලට අනුයුක්ත කර සෞඛ්‍ය සේවාව ලබාදීමට පසුගිය වර්ෂය තුළ ක්‍රියාමාර්ග නොගැනීමෙන් වෛද්‍ය උපකරණවල වගකීම් කාලයේ ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි තත්ත්වයක්ද පළාත් සභාවට උද්ගත වී තිබුණි. | හදිසි අනතුරු ඒකකය පසුගිය වර්ෂයේ ඔක්තෝබර් මාසයේ අප වෙත තාවකාලිකව භාරදී තිබූ අතර ප්‍රවර්තන වර්ෂයේ මාර්තු මාසයේ නිල වශයෙන් භාර දෙන ලදි. එම නිසා එම වත්කම් පිළිබඳ විස්තර ප්‍රවර්තන වර්ෂයට අදාල වේ. මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදි වටිනාකම ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුය. |

### 1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් ඉඩම් කොමසාරිස් සහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අතිරේක ඉන්ධන මිලදී ගැනීම්වලට අදාල රු. 478,554 ක් වූ බිල්පත් විගණනයට ඉදිරිපත් නොකිරීමෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය. | වර්තමානයේ ඉන්ධන ගනුදෙනුවලට අදාල බිල්පත් ඇමිණීමේ ක්‍රියා පිළිවෙත අනුගමනය කෙර්. | බිල්පත් ඇමිණීමේ ක්‍රියා පිළිවෙත අනුගමනය කළ යුතුය. |
| (ආ) | මන්නාරම නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය විසින් කොම්පෝස්ට් පොහොර මඩුව, අලෙවිසැල සහ දැල් නිවස ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට රු. 687,142ක් ගෙවීම් කර ඇතත් ඊට අදාල මිනුම් බිල්පත් හා ප්‍රමාණ බිලපත් ආදිය සකස් කර නොතිබුණි. | ඉදිරියේදී කාර්යයන් මුළුමනින්ම අවසන් කර මැනුම් බිල්පත්, ප්‍රමාණ බිල්පත් ආදිය නියමිත පරිදි ගෙවීම් සඳහා නිර්දේශ කිරීමෙන් පසුව පමණක් ගෙවීම් කිරීමට පියවර ගනු ලැබේ. | මිනුම් බිල්පත් හා ප්‍රමාණ බිලපත් සකස් කළ යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව උතුරු පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම

මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම, වංචාවක් ඇති වීමට හේතුවේ.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරමි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | **2016 අංක 1 දරන උතුරු පළාත් මාර්ගස්ථ මගී අධිකාරියේ ප්‍රඥප්ති** | | | | |
| | (i) 61 (අ) වගන්තිය | - | පෞද්ගලික බස්රථ, ත්‍රිරෝද රථ, සැහැල්ලු වාහන, බර වාහන හිමිකරුවන් පිළිබඳව කණ්ඩායමක් පිහිටුවා | සමිති ලියාපදිංචි කිරීම සම්බන්ධ මූලික අනුමැතීන් අදාල පාර්ශවවලින් | වාහන හිමිකරුවන් සම්බන්ධ කණ්ඩායමක් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ලියාපදිංචි කිරීමට උතුරු පළාත් මාර්ගස්ථ මගී අධිකාරිය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලබාගැනීමට හා ඉන්පසුව එ්වා ලියාපදිංචි කිරීමටත් උපදෙස් ලබාදී ඇත. | පිහිටුවා ලියාපදිංචි කිරීමට පියවර ගතයුතුය. |
| | (ii) 15 වගන්තිය | - | උතුරු පළාත් මාර්ගස්ථ මගී අධිකාරිය විසින් ලියාපදිංචි කර නියාමනය නොකළ පුද්ගලික යාන්ත්‍රික ඉංජිනේරු ආයතනවලින් ලබාගන්නා යෝග්‍යතා සහතික පදනම් කර ගනිමින් මාර්ගස්ථ මගී ප්‍රවාහන බලපත්‍ර ලබාදී තිබුණි. | ලියාපදිංචි කළ පුද්ගලික යාන්ත්‍රික ඉංජිනේරු ආයතනවලින් පමණක් අදාල සහතිකය ලබාගත හැකි බවට එකඟතාවයකට එළැඹ එය අනුමත කර මේ සම්බන්ධයෙන් සියළුම පුද්ගලික බස්රථ හිමිකරුවන්ට උපදෙස් ලබාදී ඇත. | ප්‍රඥප්තියට අනුකූලව කටයුතු කළයුතුය. |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | | |
| | (i) 2.11.2 මාර්ගෝපදේශය | - | ආයතන 06ක් විසින් ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගැයීම් කමිටු සාමාජිකයින්ගේ පැමිණීම තහවුරු කිරිම සඳහා වෙනමම පැමිණීමේ ලේඛනයක් ප්‍රවර්තන වර්ෂය වෙනුවෙන් නඩත්තු කර නොතිබුණි. | පැමිණීමේ ලේඛනය වර්තමානයේ විට නඩත්තු කෙරේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළයුතුය. |
| | (ii) 5.4.8 මාර්ගෝපදේශය | 81,975,012 | වවුනියා සහ මුලතිව් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල සහ ළමාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කළ ප්‍රසම්පාදනයන් 34කදී නියමිත ප්‍රතිශත ප්‍රමාණවලින් කාර්යසාධන ඇපකර ලබාගෙන නොතිබුණි. | ගිවිසුම්ගත කාලයෙන් වැඩිපුර දින 28ක් දක්වා කාර්යසාධන ඇපකර ලබාගත යුතු බවත්, භාණ්ඩ ප්‍රසම්පාදනයේදී ගිවිසුම් මුදලින් 10%ක කාර්යසාධන ඇපකරයක් ලබාගැනීමටත් උපදෙස් ලබාදී ඇත. | -එම- |
| | (iii) 8.9.1 (ආ) මාර්ගෝපදේශය | 33,026,498 | මුලතිව් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සහ දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ පිසූ ආහාර හා වියලි ආහාර | ඉදිරියේදී මෙමවැනි දෝෂ සිදුනොවීමට උපදෙස් ලබාදී ඇත. | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | සැපයීම් 18ක ගිවිසුම් අත්සන් නොකර සේවාවන් ලබාගෙන තිබුණි. | | |
| (ඇ) | උතුරු පළාත් සභාවේ මූල්‍ය රීති<br>(i) 107 රීතිය | 17,944,996 | ආයතන 2 ක ගෙවීම් වවුචර්පත් 25 ක් සඳහා සහතික නොකර මුදල් ගෙවා තිබුණි. | ඉදිරියේදී මෙමවැනි දෝෂ සිදුනොවීමට අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කර ඇත. | පළාත් මූල්‍ය රීතිවලට අනුකූලව කටයුතු කළයුතුය. |
| | (ii) 109 රීතිය | 1,432,934 | පාසල් 04කට අදාලව ගෙවීම් සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | -එම- | -එම- |
| | (iii) 131.3 රීතිය | 20,168,905 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වානිජ අත්තිකාරම් ගිණුම් කටයුතුහි ගොවිපල කළමනාකරු විසින් 2022 සහ 2023 වර්ෂවල මුදල් එක්රැස් කිරිමේදී අත්සන් නොකර සහ නිල මුද්‍රා නොකර ලදුපත් ලබාදී තිබුණි. | වර්තමානයේ සියළුම ලදුපත්වල අත්සන සහ තනතුරු මුද්‍රා තබා ගොනුගත කෙරේ. | -එම- |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 773(2) (ආ) | - | ඉරනමඩු වැවෙන් ඉවත්කළ කිලෝග්‍රෑම් 22,559ක් බරැති යකඩ ද්‍රව්‍ය 2018 වර්ෂයේ සිට මුදල් රෙගුලාසි ප්‍රකාරව, කර්මාන්ත ශාලා ඉංජිනේරුවරයාට ලබාදීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පළාත් සභාවට ආදායම් ලබාගැනීමට හැකි අයුරින් නියමිත ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ඉ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය | - | වාහනවල සියළු ඉන්ධන පරීක්ෂාවෙන් පසුව සහ මාස 12ක කාලයකින් පසුත් ඉන්ධන දහනය පරීක්ෂාවක් සිදුකළ යුතු වුවත් වාහන 33ක් සඳහා ඉන්ධන දහනය පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | 2024 වර්ෂයේ ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කෙරෙමින් පවතී. | චක්‍රලේඛ විධිවිධානවල ට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | 2021 දෙසැම්බර් 09 දිනැති අංක 05/2021 දරන මුදල් අමාත්‍යාංශ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | - | වත්කම් වර්ෂ 05කට වරක් ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් ආයතන 03ක වත්කම් සම්බන්ධයෙන් වර්ෂ 05ක් ඉකුත්වී තිබියදීත් නැවත ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රත්‍යාගණන කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | වත්කම් කළමනාකරණ චක්‍රලේඛ විධිවිධානවල ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (උ) | 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 2.4 ඡේදය | 6,725,000 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රජා පාදක සංවිධාන සඳහා ඍජු කොන්ත්‍රාත් 06 ක් මාන්තායි දකුණ විවිධ සේවා සමූපකාර සංගමයට ලබාදීමේදී ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී 03කට අධික කොන්ත්‍රාත් කාර්යයන් කිසියම් එක් සමිතියකට පමණක් ලබාදීම වලක්වනු ලැබේ. | රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ විධිවිධානවල ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 2.4 සහ 2.5 වගන්ති | 2,588,463 | අදාල විධිවිධානවලට පටහැනි අයුරින් නියමිත අධිකාරි බලය නොවූ ගිවිසුම් 06 ක් යටතේ එකම කාලවකවානුවක් තුළ වවුනියා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් එකම ප්‍රජා පාදක මට්ටමේ සංවිධානයකට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛයට අනුකූලව කොන්ත්‍රාත් පිරිනැමීමට උපදෙස් ලබාදී ඇත. | චක්‍රලේඛ විධිවිධානවල ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (එ) | 2015 ජූලි 14 දිනැති අංක PF/06/2015 දරන උතුරු පළාත් මූල්‍ය චක්‍රලේඛය | 35,955,165 | රු. මිලියන 0.5කට අධික ප්‍රසම්පාදනයන් 15 ක් සඳහා තාක්ෂණික ඇගැයීම් කමිටු ස්ථාපිත නොකර කිලිනොච්චිය දිස්ත්‍රික් රෝහල මගින් පර්යේෂණාගාරයට අවශ්‍ය භාණ්ඩ ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කර තිබුණි. | 2024 වර්ෂයේ සිට මෙම මිලදී ගැනීම් තාක්ෂණික ඇගැයීම් කමිටු වාර්තා සහ ප්‍රසම්පාදන කමිටු තීරණ අනු සිදු කෙරේ. | පළාත් මූල්‍ය චක්‍රලේඛ විධිවිධානවල ට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු. 3,265,159,717 ක අතිරික්තයක් තිබූ අතර ඊට අනුරූපීව පෙර වර්ෂයේ අතිරික්තය රු.2,645,712,973ක් විය.

## 3. ප්‍රඥප්ති ගිණුම් හා වානිජ අත්තිකාරම් ගිණුම්

### 3.1 ප්‍රඥප්ති ගිණුම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කිලිනොච්චිය බස්නැවතුම් පල ආපනශාලාව වර්ෂයකට බදුදීම සඳහා ලංසු කැඳවා වර්ෂ දෙකක කාලයක් ගිවිසුමකින් තොරව පවත්වාගෙන යාමට අනුමැතිය ලබාදී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු ආදායමක් උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් අයකර නොතිබුණි. | සභාපති වන ප්‍රසම්පාදන කමිටු සභාපතිවරයා ඔවුන්ගේ ඉල්ලීම සාධාරණ බව පෙනී යාම හේතුවෙන් බදු කාලය වර්ෂ 02ක් වශයෙන් වෙනස් කර ලංසු ලේඛනවල වර්ෂ 02ක් ලෙස සඳහන් කර ලබාදෙ ලදි. | නියමිත කාලයට අදාල ආදායම් එම කාලය තුළ අයකිරීමට පියවර ගතයුතු ය. |

### 3.2 වානිජ අත්තිකාරම් ගිණුම්

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනින්ජයන්කුලම අභිජනන ගොවිපලෙහි කිරි ආශ්‍රිත නිෂ්පාදන සකස්කිරිමට 2013 වර්ෂයේ මිලදීගත් යන්ත්‍රෝපකරණ 16ක් නැවත 2018 වර්ෂයේදී රු.2,550,504කට ප්‍රත්‍යාගණනය කර ඇතත් මේ වන විට වර්ෂ 10 ක් කල් ඉකුත් වී තිබූ මෙම යන්ත්‍ර භාවිතයට ගත නොහැකි තත්ත්වයෙන් මලබැදී තිබුණි. එසේම, රු.3,000,000ක් වූ ගොඩනැගිල්ලද වර්ෂ 10ක කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවැතුණි. | අනින්ජයන්කුලම අභිජනන ගොවිපලෙහි කිරි නිෂ්පාදන නොමැති වීමත් අනෙකුත් සම්පත් නොමැතිවීම නිසාත් සත්ත්ව අභිජනන සමූපකාර වෙත කිසියම් නිශ්චිත කාලයකට බදු දීමට කටයුතු කරමින් පවතී | ගොවිපල සතු සම්පත්, ප්‍රශස්ථ මට්ටමින් භාවිතා කිරීමට පියවර ගතයුතු ය. |
| (ආ) | ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් පරිත්‍යාග ලෙස රජයේ බීජ නිෂ්පාදන ගොවිපළට රු.1,386,000ක TSP පොහොර හොන්ඩර 126 ක ප්‍රදාන ලැබී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ උපයෝජනය කළ ඉහත පොහොරවල වටිනාකම අඩු නොකිරිම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වානිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තේ ආදායම රු.1,386,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම දෝෂ 2024 වර්ෂයේ ලාභ ගැලපුම් ප්‍රකාශය මගින් නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | භාවිතා කළ පොහොරවල නිවැරදි වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දැක්වීමට පියවර ගතයුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021/2023 කාල පරිච්ඡේදයේ උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේනතුව විසින් රු.440,000කට මිලදීගෙන රජයේ බීජ නිෂ්පාදන ගොවිපළට ලබාදුන් යන්ත්‍රෝපකරණ 02ක් මිලදීගත් වටිනාකමින් නොපෙන්වා රු.17,000කට දැක්වීමෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වානිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තේ යන්ත්‍රෝපකරණවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.423,000කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ සිදුවූ මෙම දෝෂය 2024 වර්ෂෙයේ ලාභ ගැලපුම් ප්‍රකාශය මගින් නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | නිවැරදි වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දැක්වීමට පියවර ගතයුතු ය. |
| (ඈ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වානිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තේ 2013 වර්ෂයේ JPN ව්‍යාපෘතියෙන් ධාන්‍ය බීජ ශීතකර ආරක්ෂා කිරීම සඳහා ලැබුණු ශීතාගාර සහිත ගබඩාවක් රු.1,335,000කට අගය කර තිබුණි. එසේ වුවත්, එහි පිරිවැය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වානිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ වත්කම්වල වටිනාකම ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කෙරේ. | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ජංගම වත්කම්වල අවසන් තොගයේ වටිනාකම, තොග ලෙජරය අනුව රු.37,352ක් ලෙසත් තොග ඇගැයීම් වාර්තා ප්‍රකාරව රු.1887,500ක් ලෙසත් දැක්වීම හේතුවෙන් රු.1,850,148 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම තොගය 2024 වර්ෂය සඳහා වූ අවසන් ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | තොගවල නිවැරදි වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දැක්වීමට පියවර ගතයුතු ය. |
| (ඊ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වානිජ අත්තිකාරම් ගිණුම් කටයුත්ත යටතේ වූ රජයේ බීජ නිෂ්පාදන ගොවිපළෙහි පවතින රු.500,000ක් වූ Compost grader පසුගිය වර්ෂ 02ක කාලයක් නිෂ්කාර්ව පැවැතුණි. | කාබනික පොහොර සඳහා ඉල්ලුම අඩුවීම හේතුවෙන් විශාල ප්‍රමාණයෙන් නිෂ්පාදනයක් සිදු නොවීය. කෙසේවෙතත්, මධ්‍යස්ථානයට අවශ්‍ය නිෂ්පාදන විටින් විට සිදු කෙරේ. | ගොවිපල සතු සම්පත්, ප්‍රශස්ථ මට්ටමින් භාවිතා කිරීමට පියවර ගතයුතු ය. |
| (උ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වානිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තේ ප්‍රත්‍යාගණනය නොකළ ගොඩනැගිලි, ප්‍රත්‍යාගණනය කළ බව දැක්වීම හේතුවෙන් මේ දක්වා සිදුකළ ක්ෂය ප්‍රතිපාදන වෙන්කිරිම් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණි. මේ හේතුවෙන් ශුද්ධ වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.7,901,713කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉඩමේ හිමිකාරිත්වය පවරා ගැනීමේ තවදුරටත් සි දුකෙරෙමින් පවතී. | නිවැරදි වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දැක්වීමට පියවර ගතයුතු ය. |

## 3.3 වෙනත් අත්තිකාරම් ගිණුම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ආයතන 03 ක විශ්‍රාම ගිය හා සේවය හැරගිය නිලධාරීන් එකතුව 21 ගෙන් අයවිය යුතු සේවක ණය ශේෂ එකතුව රු.3,844,025ක් අයකර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | රජයේ සේවක ණය ශේෂ අයකර ගතයුතු ය. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 රජයේ ප්‍රදාන

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවිධ ව්‍යාපෘති මගින් පළාත් සභාවට ලබාදුන් පරිත්‍යාග හා ප්‍රදානවලින් රු. මිලියන 3,235ක අරමුදල් ඌන උපයෝජිතව පැවතුණි. | | කාලවකවානුවට අදාල අරමුදල් ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කළයුතුය. |

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් වසර 06 සිට 11 දක්වා වූ සිසුන්ට 2023 වර්ෂයේදී 2022 වර්ෂය සඳහා පවත්වනු ලැබූ අවසාන වාර විභාගය වෙනුවෙන් රු.18,950,100 ක් අයකර තිබුණි. ඉන් රු.13,926,892 ක මුදල් ඒ සඳහා වැයකර තිබූ අතර එමගින් වැඩියෙන් අයකළ රු.5,023,208ක් සිසුන් මත අනවශ්‍ය වැය බරක් පටවා තිබුණි. තවද එය පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ඊළඟ විභාගයේදී සිසුන්ගෙන් අඩුවෙන් ගාස්තු අයකිරිමට තීරණය කර ඇත. | සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු ය. |
| (ආ) | රජයේ කාර්යාලවල නිලධාරීන්ගේ වාර්ෂික කාර්යසාධනය ඇගැයීමට ලක්කර වාර්ෂික වැටුප් වර්ධක ලබාදිය යුතු වුවත්, අධ්‍යාපන කලාප 12ක සේවය කරන නිලධාරීන් 156කට වාර්ෂික වැටුප් වර්ධක 01 සිට 25ක් දක්වා ලබාදී නොතිබුණි. | නිලධාරීන්ට වාර්ෂික වැටුප් ලබාදීමට පියවර ගෙන ඇත. | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීමට පියවර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ වූ විදුහල්පතිවරුන් දෙදෙනෙකු සේවයේ යෙදී සිටියදී මියගොස් තිබූ නමුත් ඔවුන්ගේ පුද්ගලික ලිපිගොනු විධිමත්ව පවත්වා නොතිබීමෙන් එම නිලධාරීන්ට හිමිවිය යුතු මරණ පාරිතෝෂිකය ඇතුළු අනෙකුත් ප්‍රතිලාභ ලැබී නොතිබුණි. | වර්තමානයේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ඉදිරි පියවර ගනිමින් පවතී. | සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතු ය. |
| (ඈ) | පත්වීම් ලබා වර්ෂ 03ක කාලයක් ඉකුත් වී තිබූ නමුත් අධ්‍යාපන කලාප 10ක පිහිටි පාසැල් 20ක සේවය කරන නිලධාරින් 49කගේ පත්වීම් ස්ථිර කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර රජයේ නිලධාරීන්ගේ කාර්ය පටිපාටි රීතින්හි VIII රීතිය ප්‍රකාරවද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අධ්‍යාපන සුදසුකම් සම්බන්ධ සහතික සනාථ කිරීමේ කටයුතු සම්පූර්ණ නොකිරිම් හැර අනෙකුත් නිලධාරීන් සඳහා තනතුර ස්ථිර කිරීමේ කටයුතු සිදුකර ඇත. | කාර්ය පටිපාටි රීති ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | වැඩ සුපරීක්ෂක ලෙස 2014 ඔක්තෝබර් 24 දින පත්වීම් ලැබූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 39කගේ හා මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින් 04කගෙන් 2015 අප්‍රේල් මාසයේ සිට 2024 පෙබරවාරි මාසය දක්වා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා රු.5,520,153ක් ඔවුන්ගේ වැටුපෙන් අයකර තිබූ නමුත්, එම නිලධාරීන්ගේ නමට විශ්‍රාම වැටුප් දායක මුදල් හඳුනාගත හැකි පරිදි විශ්‍රාම වැටුප් අංක සඳහන් කර ගෙවීම් කර නොතිබුණි. | අදාල නිලධාරින්ට විධිමත් පත්වීම් ලබාදීමෙන් පසු ඔබ විසින් අනාවරණය කර තිබූ නිලධාරීන්ගේ නමින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අංක ලියාපදිංචි කර අදාල නිලධාරීන්ට ලබාදීමට කටයුතු කරනු ලැබේ. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අනතුරට ලක්වූ වාහන 06 ක් සඳහා රක්ෂණ ආයතනයෙන් වන්දි ගෙවිය නොහැකි බව සඳහන් කර තිබූ නමුත් ඒවා යථා තත්ත්වයට පත්කිරීමට හෝ අයකර ගැනීමට වර්ෂ 01 සිට 13ක් දක්වා කාලයක් තුළ ක්‍රියාමාර්ග නොගැනීම නිසා රු.22,573,727ක අලාභ සිදුවී තිබුණි. | අනතුරට ලක්වූ වාහන 06 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇත. | -එම- |
| (උ) | උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු බලප්‍රදේශයට අයත් පේදුරුතුඩුව රෝහලේ 2016 ඔක්තෝබර් මාසයේ රු. මිලියන8 කට මිලදී ගත් incinerator පිළිස්සුම් යන්ත්‍රය ප්‍රමාණවත් සැලැකිල්ලකින් හා ආරක්ෂාවක් සහිතව පාවිච්චි නොකිරීම හේතුවෙන් ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයේ පැවැති අතර එහි දුම් පිටවීමේ චිමිනිය සම්පූර්ණයෙන් මලකඩ කා මුළුමනින්ම අක්‍රිය තත්ත්වයට පත්වී තිබුණි. | ජනතා විරෝධය හේතුවෙන් එම පිළිස්සුම් යන්ත්‍රයේ මෙහෙයුම් නවතා දැමූ අතර පර්චස් 20ක ඉඩමක් මිලදී ගෙන ලබාදීමට ප්‍රාදේශීය සභාව එකඟවී ඇත. | පිළිස්සුම් යන්ත්‍රය ස්ථාපිත කිරීමට සුදුසු පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | වවුනියා රජයේ රෝහලේ දුරකථන සන්නිවේදන කුළුණු දෙකක් සඳහා වෙනමම උපමනු සවිකර තිබුණි. සන්නිවේදන ආයතන දෙකෙන්ම විදුලි ගාස්තු නියමිත කාලපරිච්ඡේදයේ අයකර නොතිබූ අතර වවුනියා දිස්ත්‍රික් රෝහල විසින්ම විදුලි ගාස්තු ගෙවීම සිදුකර තිබුණි. එසේම, දුරකථන සන්නිවේදන කුළුණු ආදායම 2016 පෙබරවාරි 01 සිට 2022 ජනවාරි 31 දක්වා කාලපරිච්ඡේදයේ වවුනියා දිස්ත්‍රික් රෝගීන්ගේ සුභසාධක සංගමයට මාරුකිරීම නිසා කුළුණු කුලී ආදායම් රු.4,538,106ක්ද අහිමි වී තිබුණි. | ඉදිරි කාලයේදී රෝහල් පරිපාලනය විසින් ගිවිසුම් අළුත්කර ආදායම් අයකිරීමට උපදෙස් ලබාදී ඇත. | ආදායම් අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| | වවුනියා දිස්ත්‍රික් රජයේ රෝහල් පරිශ්‍රයේ පිහිටි පෞද්ගලික බැංකු දෙකකින් එක් බැංකුවකින් මාසික කුලී අයකරනු ලබන අතර එම මුදල පළාත් සභාවේ ආදායමට මාරුනොකර රෝගීන්ගේ සුභසාධක සංගම් ගිණුමේ තැන්පත් කර තිබුණි. එසේම, අනෙක් පුද්ගලික බැංකුවෙන් කිසිදු කුලී මුදලක් අයකර නොතිබුණි. | මෙම ආදායම් ඉදිරියේදී පළාත් සභාවට මාරු කිරීමට උපදෙස් ලබාදී ඇත. | -එම- |
| (එ) | මුලතිව් ප්‍රාදේශීය සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් 164කට පසුගිය වර්ෂ 21ක කාලයක සිට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අංක ලබාදී නොතිබුණි. | ඔවුන් සඳහා විධිමත් පත්වීම් ලිපි ලැබීමෙන් පසුව W&OP අංක ලබාගැනීමේ කටයුතු සිදු කෙරේ. | විශ්‍රාම වැටුප් අංක ලබාදීමට සුදුසු පියවර ගත යුතුය. |
| (ඒ) | උතුරු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාපනය, මන්නාරම, කිලිනොච්චිය, වවුනියා සහ මුලතිව් දිස්ත්‍රික්කවල පළාත් පාලන ආයතන බලප්‍රදේශයවලට අදාල කාරණා සම්බන්ධයෙන් වාර්තා වූ පැමිණිලි 77 ක් පිළිබඳව ඵලදායී ක්‍රියාමාර්ග කිසිවක් ප්‍රවර්තන වර්ෂයේ ගෙන නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුවට ලැබී තිබූ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඔ) | පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව විසින් ගොඩනැගිලි 03 ක් සහ ඉඩම් 19 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ විසින් ගොඩනැගිලි 03 ක් සහ ඉඩම් 19 ක් තක්සේරු කිරිම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇත. | ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයා විසින් යාපනය, වවුනියා, මන්නාරම සහ මුලතිව් කාර්යාල ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම්වල වටිනාකම තක්සේරු කිරිම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලැබේ. | -එම- |
| (ක) | වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරනු ලබන රු.3,200,000ක් වටිනා වාහන 11ක් උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ නමට මාරුකර නොතිබූ අතර එම වාහනවල පොත්ද වාර්තා කරන දින වන විටත් ලැබී නොතිබුණි. එසේම, ධාවනයේ පවතින වාහන හඳුනාගත හැකි පරිදි රාජ්‍ය ලාංඡනය වාහනවල බඳෙහි මුද්‍රණය කර නොතිබුණි. | වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හිමිකාරිත්වය මාරු නොකළ වාහන 11ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ග) | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන රු.6,200,000ක් වටිනා වාහන 02ක් සහ වටිනාකම තක්සේරු නොකළ වාහනයක්ද උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ නමට හිමිකාරිත්වය මාරුකර නොතිබූ අතර එම වාහනවල පොත්ද වාර්තා කරන දින වන විටත් ලැබී නොතිබුණි. | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන ඇත. | ප්‍රධාන ලේකම්වරයාගේ නමට හිමිකාරිත්වය මාරුකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ච) | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි 10ක වටිනාකම තක්සේරු කර ජංගම නොවන වත්කම්වල ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු කිරිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට ලිපි යවා ඇත. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වටිනාකම් ලැබීමෙන් පසුව ගිණුම්ගත කරනු ලැබේ. | වටිනාකම තක්සේරු කිරිමට පියවර ගත යුතුය. |
| (ට) | උතුරු පළාත් රියැදුරු සේවයේ නිලධාරීන්ට 2017 වර්ෂයෙන් පසුව වාර්ෂික ස්ථානමාරු නියෝග ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ඇතැම් දෙපාර්තමේන්තුවල රියැදුරන් වර්ෂ 06 සිට 19ක් දක්වා අඛණ්ඩව සේවය කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ස්ථානමාරු නියෝග ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |

## 4.3 මතභේදාත්මක ස්වරූපයේ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාසැල් වර්ගීකරණ චක්‍රලේඛ අනුව දීමනා සංශෝධනය නොකර 2019 වර්ෂයේ සිට සමාලොචිත වර්ෂය දක්වා දූපත් අධ්‍යාපන කලාපයේ ගුරුවරුන්ට ගෙවනු ලැබූ රු. 10,230,397ක වැඩිපුර ලබාදුන් දීමනා මේ දක්වා ආපසු අයකර නොතිබුණි. | ගුරුවරුන්ට වැඩිපුර ගෙවනු ලැබූ දීමනා අයකර ගැනීමට පියවර ගනිමින් පවතී. | වැඩිපුර ගෙවනු ලැබූ දීමනා නැවත අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | ආණ්ඩුකාර කාර්යාලය විසින් 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ වාහන ධාවන සටහන්, ඇමුණුම 01 ආදිය කිසිවක් නොමැතිව රියැදුරන්ගේ අතිකාල දීමනා සහ සංයුක්ත දීමනා ලෙස එකතුව රු.1,384,407ක් ලබාදී තිබුණි. | ගෞරව ආණ්ඩුකාරවරයා සහ ඔහුගේ පුද්ගලික ලේකම්වරයාගේ ආරක්ෂාව සලකා වාහන ධාවන සටහන් කිසිදු කාලයක ඉදිරිපත් නොකෙරේ. | චක්‍රලේඛය ප්‍රකාරව, සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය ප්‍රකාරව ආණ්ඩුකාරවරයාට ආහාර සම්බන්ධ දීමනා පිළිබඳ කිසිවක් සඳහන් කර නොතිබූ නමුත් 2021 දෙසැම්බර් සිට 2023 මැයි දක්වා කාලපරිච්ඡේදයට ආහාර සඳහා එකතුව රු.4,037,299ක් ගෙවා තිබුණි. | ආණ්ඩුකාරවරයාගේ නියෝග අනුව ඔහු විසින් සඳහන් කරන පුද්ගලයාට ගෞරව ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ වැය ශීර්ෂය මගින් ආහාර සඳහා ගෙවීම් සිදු කර තිබුණි. | -එම- |
| (ඈ) | ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් සිට 2023 මැයි දක්වා කාලපරාසයේ සම්බන්ධීකරණ ලේකම්, අතිරේක ලේකම්, මහජන සම්බන්ධතා නිලධාරී ආදි අය ස්වකීය වාහන භාවිතා කරන බව සඳහන් කරමින් ප්‍රවාහන දීමනා ලබාගෙන තිබූ නමුත් මාස 33කට අධික කාලපරිච්ඡේදයක් වෙනුවෙන් රියැදුරන්ට වැටුප් රු.1,344,644ක් සහ මීට අමතරව රියදුරන් සඳහා අතිකාල දීමනා හා සංයුක්ත දීමනා ආදියත් ලබාදී තිබුණි. | 2021 දෙසැම්බර් සිට 2023 මැයි දක්වා කාලපරාසයේ සේවය කළ ආණ්ඩුකාරවරයාගේ පරිහරණය සඳහා පැවැති වාහන සංඛ්‍යාවට අනුකූලව රියදුරන් පත්කර තිබුණි. ආණ්ඩුකාරවරයාගේ ආරක්ෂාව සැලකිල්ලට ගෙන රියදුරු පත්වීම් සම්බන්ධ ඉල්ලුම්පත් ගෞරව ආණ්ඩුකාරවරයා විසින්ම පරිශීලනය කර ගෞරව ආණ්ඩුකාරවරයාගේ උපෙදස් පරිදි පත්වීම් ලබාදී තිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (i) | ආණ්ඩුකාරවරයා වෙනුවෙන් කොළඹ උපකාර්යාල ගොඩනැගිලි මාසික කුලිය ප්‍රධාන තක්සේරුකරු විසින් රු.100,000ක් බව සඳහන් කර තිබූ නමුත් මෙම තක්සේරුවට පටහැනිව මාසිකව වැඩිපුර රු.80,000ක් බැගින් ගෙවීම් කිරීම හේතුවෙන් පළාත් අරමුදලට රු.1,240,000ක මූල්‍ය පාඩුවක් සිදුවී තිබුණි. | ප්‍රධාන තක්සේරුකරු විසින් රු.100,000ක් බව සඳහන් කර තිබූ නමුත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සහිතව ගෙවීම් කර තිබුණි. | -එම- |
| (ii) | ගොඩනැගිලි 02ක් ආණ්ඩුකාරවරයාගේ උපකාර්යාල අවශ්‍යතාවන් සඳහා කුලියට ලබාගෙන තිබූ කාලවකවානුවේදීම ඊට පෙර ලබාගත් භාවිතා නොකළ ගොඩනැගිල්ලට මාස 3 ½ ක කාලයක් සඳහා වැඩිපුර තවත් රු.630,000ක් ගෙවීම අනවශ්‍ය වියදමක්වී තිබුණි. | ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සහිතව මාස 3 ½ ක කාලයක් සඳහා ගල්කිස්ස කාර්යාලයට කුලිය ගෙවා තිබුණි. | -එම- |
| (iii) | ආණ්ඩුකාරවරයාගේ පෙර පැවැති කොළඹ උපකාර්යාලයේ 2021 ඔක්තෝබර් මාසයේ සිට 2022 ජනවාරි 28 දින දක්වා කාලපරිච්ඡේදය තුළ භාවිතා නොකළ ගොඩනැගිල්ලේ ආරක්ෂක සේවාව සඳහා රු.319,031ක් ගෙවා තිබුණි. | ගොඩනැගිල්ලේ සහ භාණ්ඩවල ආරක්ෂාව වෙනුවෙන් ආරක්ෂක සේවාව ලබාගන්නා ලදී. | -එම- |
| (iv) | 2021 දෙසැම්බර් සිට 2023 මැයි දක්වා මාස18ක කාල පරිච්ඡේදයේ පුද්ගලික ලේකම්වරයා මාස16ක්ද, සම්බන්ධීකරණ ලේකම්වරුන් මාස 04ක් ද, මාධ්‍ය ලේකම් මාස 12ක් සහ ජනමාධ්‍ය සම්බන්ධීකරණ නිලධාරිට මාස 03ක කාලයක් සඳහා පත්වීම් ලබාදී නොතිබියදී එම තනතුරුවලට හිමි නිලධාරී ඉන්ධන දීමනා සහ ප්‍රවාහන දීමනා ලබා ගෙන තිබූ නමුත් ආණ්ඩුකාරවරයා විසින් ඔවුන්ට අදාල වාහන ස්වකීය අවශ්‍යතා සඳහා යොදාගැනීම හේතුවෙන් රු.640,000ක් වැඩිපුර දීමනා ලෙස ගෙවා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | -එම- |

**4.4 ද්‍රව්‍ය අක්‍රමිකතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ‘ළමුන් ආරක්ෂා කරමු විදේශ පරිත්‍යාගශීලි ආයතනයේ කිලිනොච්චිය දකුණ කලාපයෙන් පසුගිය වර්ෂ 02 කට පෙර ලැබී තිබූ රු. මිලියන 2 ක වංචල උපකරණ 08ක් භාණ්ඩ ලේඛනයේ ලේඛනගත නොකර හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුනොකර නිෂ්කාර්ය ලෙස රඳවා තබාගෙන 2024 වර්ෂයේ අදාල පරිත්‍යාගශීලි වෙත ආපසු ලබාදී තිබුණි. | අදාල කරුණ සම්බන්ධයෙන්, පළාත් අධ්‍යාපන දෙපාර්තෙමේන්තුව විසින් පත්කළ විමර්ශන කමිටුව විසින් මේ පිළිබඳව විමර්ශන කටයුතු සිදුකරනු ලැබේ. වාර්තාව ලැබූ විගස ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපදෙස් ලබා දී ඇත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාත්‍යන්තර කම්කරු සම්මේලන වැඩසටහන යටතේ ජාතික වෘත්තීය සහතික ලබාදීමේ පුහුණු පාඨමාලාව සඳහා පළාත් භාණ්ඩාගාරයෙන් 2023 අප්‍රේල් 10 දින රු.3,299,000ක අක්මුදල් ලබාදී තිබුණි. එම අරමුදල්වලින් සියයට 59ක් හෙවත් රු.1,950,000ක් මාස 11ක් ඉකුත් වූ පසුත් උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4.6 හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 01 සිට 27ක් දක්වා කාලයක් තුළ උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් පාසැල් 35ක යුද්ධය හා සොරකම යනාදි හේතු නිසා සිදුවූ එකතුව රු.11,587,195ක පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නිරවුල් කිරීම සිදුකර නොතිබුණි. | 1995 වර්ෂයේ සිට මේ දක්වා යුද්ධය හා සොරකම හේතුවෙන් පාසැල්වලට සිදුවූ පාඩු පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව විමර්ශන කමිටු ස්ථාපිත කර මූලික විමර්ශන කටයුතු සිදුකර කපාහැරීම් සම්බන්ධ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ආ) | උතුරු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාහනයක් 2016 ඔක්තෝබර් 13 දින රියැදුරුගේ නොසැලකිල්ලෙන් අනතුරට ලක්විය. එම අනතුරෙන් සිදුවූ රු.620,760ක පාඩුව රියැදුරුගෙන් අයකර ගතයුතු බවට විමර්ශන අවසානයේ තීරණය කර තිබූ නමුත් එම පාඩුව වාර්තා කරන දිනටත් අයකර ගෙන නොතිබුණි. | අදාල රියැදුරු විසින් අලාභය නොගෙවීම හේතුවෙන් පළාත් නීති උපදේශකවරයාට එම රියැදුරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට ලිපි යවා ඇත. | අයකර ගැනීමට පියවර ගතයුතුය. |

## 4.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### 4.7.1 අත්හැර දැමූ ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂයේ රු.22,900,000කට ඇස්තමේන්තු කර තිබූ ව්‍යාපෘති 03කට සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු.5,334,611ක් වැය කිරීමෙන් පසු අත්හැර දමා තිබුණි. | ඉදිරි කාලයේදී ලෝක බැංකු හා ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ වැව් නඩත්තු කිරීමට යෝජනා ඉදිරිපත් කර පිළිගැනීමට නියමිතයි. | නියමිත කාලය තුළ සම්පූර්ණ කර සේවාවන් සැපයීමට පියවර ගත යුතුය. |
| (ආ) | පාවට්කුලම් වී වෙලීමේ මතුපිට භූමිය සකස් කිරීම සඳහා 2021 ජූලි 19 දින සිට 2021 සැප්තැම්බර් 19 දින දක්වා කාලයට ගිවිසුම්ගතව මාස 14ක් කාලය දීර්ඝ කිරීම් ලබාදී තිබුණත් කාර්යය අවසන් නොකර රු.605,958ක් ගෙවා තිබියදී අත්හැර දමා තිබුණි. | අදාල ව්‍යාපෘතියට කාලය දීර්ඝ කිරීම් ලබාදී තිබූ නමුත් කාර්යය නිම නොකිරීම හේතුවෙන් ඒ සඳහා ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත් වටිනාකමින් 5%ක් වන රු.50,000ක් එම කොන්ත්‍රාත්කරුගෙන් අයකිරීමෙන් පසුව අවසන් ගෙවීම් සිදුකරන ලදි. මේ වන විට නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම කාර්යාලය වවුනියා විසින් නැවත වෙළෙඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ ලංසු කැඳවා කොන්ත්‍රාත්කරු තෝරා ගිවිසුම් අත්සන් කර කාර්යය සිදු කරමින් පවතී. | -එම- |

## 4.8 වත්කම් කළමනාකරණය

### 4.8.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු පළාත් පාසැල්වල පවතින ඩෙස්ක්ටොප් පරිගනක 1,316ක්, ලැප්ටොප් පරිගනක 101ක්, ටැබ් 186ක්, මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් 91ක් සහ ස්මාර්ට් බෝඩ් 38ක් අක්‍රීය වී තිබූ නමුත් ඒවා අළුත්වැඩියා කර භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි. | පාසැල්වල ඇති අක්‍රීය පරිගනක වර්තමාන කලාප කාර්ය මණ්ඩලය හා ජාතික දෘඩාංග කාර්ය මණ්ඩලය විසිනුත් අළුත්වැඩියා කිරීමේ කටයුතු කරනු ලැබේ.<br>Smart Board සහ මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් අළුත්වැඩියාව සඳහා අපගේ දෘඩාංග කාර්ය මණ්ඩලයට වැඩිදුර පුහුණුවීම් අවශ්‍යවේ. ඉතා ඉක්මනින් මෙම පුහුණුව ලබාදීමෙන් පසුව මෙම අළුත්වැඩියා සිදුකරනු ලැබේ. | අළුත්වැඩියා කර භාවිතා කිරීමට පියවර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | උතුරු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රු.5,046,000ක් වටිනා වාහන 07ක් නියමිත කාලපරිච්ඡේදයේදී අළුත්වැඩියා නොකිරීමෙන් වර්ෂ 02 සිට 04ක් දක්වා කාලයක් නිෂ්කාර්යව පැවැතුණි. තවද නේවාසිකාගාර 03කින් රු.3,650,000ක් වටිනා නේවාසිකාගාරයක් හා වටිනාකම තක්සේරු නොකළ නේවාසිකාගාර දෙකක්ද නියමිත කාලපරිච්ඡේදයේ අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් වර්ෂ 05 සිට 15ක් දක්වා කාලයක් නිෂ්කාර්යව පැවැතුණි. | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාහන 07න් වාහන 05ක් (NPKB 9036 NPTH 1096 NPTV 8096 NPVH 5334 NPVH 5337) අළුත්වැඩියා කිරිමට පියවර ගෙන ඇති අතර වාහන දෙකක් සඳහා (NPHH 6129, NPVH 5348) අරමුදල් හා යන්ත්‍ර අමතර කොටස් නොමැතිවීමෙන් අලුත්වැඩියා නොකෙරුණි. වර්තමානයේ අළුත්වැඩියා කිරිමට පියවර ගෙන ඇත.<br><br>අදාල නේවාසිකාගාර 3ම 2025 වර්ෂයේ අයවැය මගින් නඩත්තු වියදම් යටතේ අළුත්වැඩියා කිරීමට සැලැසුම් කර ඇත. | -එම- |

### 4.8.2 විධිමත්ව පවරා නොගත් ඉඩම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රජයේ පාසැල් 06ක ඉඩම් 06 ක් පුද්ගලික හා අනෙකුත් පාර්ශව විසින් බලෙන් අල්ලා ගෙන තිබූ නමුත් එම රජයේ වත්කම් අත්පත් කර ගැනීමට පළාත් පරිපාලනය සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රජයේ පාසැල් 06ට අයත් ඉඩම්, කුඹුරු අත්පත් කර ගැනීමට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන ඇත. | රජයේ වත්කම් අත්පත් කර ගැනීමට පියවර ගත යුතුය. |

### 4.9 කාර්ය මණ්ඩල පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට ගුරුවරුන්ගේ කාර්ය මණ්ඩලය විගණනයේදී උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු සම්පත් බෙදීයාම සියළුම සිසුන්ට ඵලදායි අයුරින් කාර්යක්ෂමව, සමානුපාතිකව, බෙදීගොස් නොතිබූ අතර කලාප 13ක අතිරික්ත 560 ක් | ගුරු කාර්ය මණ්ඩලයේ ස්ථානමාරුවලට අමතරව, විදේශ නිවාඩු, දේශීය නිවාඩු සහ අනෙකුත් දීර්ඝ කාලීන නිවාඩු, විශ්‍රාම යාම්, සේවය අතහැර යාම වැනි කාරණා නිසා අඛණ්ඩව සිදුවන හෙයින් මේ වන විට පළාත් මට්ටමින් සිදුවූ ස්ථාන මාරු මගින් මෙම තත්ත්වය යම් ප්‍රමාණයකට නිරවුල් කර ඇත. එසේම, වර්තමානයේ පළාත් මට්ටමෙන් වූ ස්ථානමාරු සඳහා අභියාචනා කමිටු තීරණ ප්‍රකාරව කලාප අතරේ වූ වාර්ෂික ගුරු ස්ථානමාරු සහ සේවයේ | ගුරු සම්පත් බෙදීයාම සමානුපාතිකව බෙදාහැරීමට පියවර ගතයුතු ය. |

| | | |
|---|---|---|
| | හා පුරප්පාඩු 439 ක් ඇතිවන පරිදි ගුරු කාර්ය මණ්ඩලය බෙදීගොස් සේවය සපයා තිබුණි. | අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් සිදුවන ස්ථානමාරුද කලාප අතර සිදුවන වාර්ෂික ස්ථානමාරුත් ක්‍රියාත්මක වන බැවින් මෙම තත්ත්වය හැකිතාක් දුරට නිරවුල් කරනු ලැබේ. එසේම, අ.පො.ස (උ/පෙළ) විෂයන් සඳහා පවතින පුරප්පාඩුවලට වර්තමානයේ නව පත්වීම් ද ලබාදී ඇත. |
| (ආ) | කලාප 09ක සේවය කරන ගුරුවරුන්, විදුහල්පතිවරුන් හා අනෙකුත් කාර්ය මණ්ඩල නිලධාරීන් එකතුව 96 ක් සඳහා ශ්‍රේණියේ උසස්වීම් ලැබිය යුතු කාලපරාසයන් ඉක්ම ගොස් වර්ෂ 01 සිට 20 ක් දක්වා කාලයක් ඉක්ම ගොස් ඇතත් අදාල උසස්වීම් ලබාදී නොතිබුණි. | 2022.10.22 දිනෙන් පසුව පත්වීම් ලබන ගුරුවරුන්ට තනතුරු උසස් වීම් සඳහා වෘත්තීය සමාලෝචනය අවශ්‍ය බව අංක ED/2/29/02/02/20 දරන 2024.01.01 දිනැති ලිපිය හා අංක 50/2023 දරන චක්‍රලේඛය මගිනුත් අනිවාර්ය කර ඇති බැවින් අදාල දිනයෙන් පසුව සිදුකරන තනතුරු උසස් කිරීමේ කටයුතු සිදු නොකරන ලදී. එසේම, කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් නොාවන විදුහල්පති සහ ගුරුවරුන් සඳහා වන තනතුරු උසස්වීම්ද ලබාදිය නොහැකිව පවතී. ඉහත කාරණා හේතුවෙන් තනතුරු උසස්වීම් ලබාදිය නොහැකිව පවතී. අදාල කාණ්ඩය තුළට නොගැනෙන අනෙකුත් නිලධාරීන්ට තනතුරු උසස්වීම් ලබාදීමට පියවර ගෙන ඇත. |
| (ඇ) | පාසැල් 30ක ගුරුවරුන් 69ක් ඔවුන්ගේ තනතුරු උසස්වීම් ප්‍රමාදවී ලබාගෙන තිබූ නමුත් ඔවුන්ට හිමි හිඟවැටුප් ගණනය කර ලබාදීමට පියවර ගෙන නොතිබුණි. | හිඟ වැටුප් ගණනය කිරීම් සිදුකර ඒ සඳහා ප්‍රතිපාදන සැලැසීම් හා අක්මුදල් ලැබෙන පරිදි ඉදිරි කාල වකවානුවල අදාල හිඟ වැටුප් ගෙවනු ලැබේ. |

**4.10 ප්‍රසම්පාදනයන්**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ රීති අංක SBD/03 ප්‍රකාරව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කාලය දීර්ඝකිරීම් ලබාදී තිබූ නමුත් එම නියමිත කාලය තුළ ව්‍යාපෘති 04 ක් ඉටුනොකිරීම වෙනුවෙන් වූ කාලය ප්‍රමාදවීමේ ප්‍රමාද දඩගාස්තු රු.189,813ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොතිබුණි. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති 04 ක් නියමිත කාලය තුළ ඉටුකර නොමැති වීමෙන් කාලය ප්‍රමාද වීමේ දඩ ගාස්තු අය කිරීමට පියවර ගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 04 ක් හා දිස්ත්‍රික් කාර්යාලවල ප්‍රසම්පාදනයන් විගණනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.61, 5.3.10, 7.9.11 හා 7.10 යනාදි මාර්ගෝපදේශයන්ට පටහැනි අයුරින් පූර්ව සුදුසුකම් ඇගැයීම, සුදුසුකම් ඇගැයීම, මිල ගණන්වල වලංගු කාලය සැලකිල්ලට ගැනීම, තාක්ෂණික කමිටු ස්වකීය රාජකාරි ඉටු නොකිරීම හා කාර්යක්ෂම සේවාවන් ලබාගැනීම ආදියෙහි ප්‍රසම්පාදන ක්‍රියාවලියේ නොසැසඳීම් පැවතුණි. | ඉදිරියේදී තෝරා ගනුලබන ලංසුකරු සම්බන්ධයෙන් පූර්ව සුදුසුකම් ඇගැයීම් සිදුකරනු ලැබේ. | -එම- |